# මිනින්දෝරු දෙපාර්තමේන්තුව

**මිනින්දෝරු දෙපාර්තමේන්තුවේ සේවයේ නියුතු රජයේ මිනින්දෝරු නිලධාරීන්ගෙන් පහත සඳහන් දෙපාර්තමේන්තුවල පුරප්පාඩු පිරවීම සඳහා අයදුම්පත් කැඳවනු ලැබේ.**

පුරප්පාඩු පවතින දෙපාර්තමේන්තු -:

01. ඉඩම් කොමසාරිස් ජනරාල් දෙපාර්තමේන්තුව
02. දුම්රිය දෙපාර්තමේන්තුව
03. වෙරළ සංරක්ෂණ සහ වෙරළ සම්පත් කළමනාකරණ දෙපාර්තමේන්තුව

ඉහත දෙපාර්තමේන්තු වෙත අයදුම් කිරීම සඳහා නිලධාරීන් පහත සුදුසුකම් සපුරා තිබිය යුතුය.

| | | | |
|---|---|---|---|
| 1. | තනතුර | -: | ශ්‍රී ලංකා මිනින්දෝරු සේවය |
| 2. | ශ්‍රේණිය | -: | III ශ්‍රේණිය |
| 3. | වයස් සීමාව | -: | අවුරුදු 52 ට අඩු |
| 4. | සේවා කාලය | -: | ස්ථිර සේවයේ වසර 05 ක සේවා කාලය |

දැනට වසර තුනක් (03) හෝ ඊට වඩා වැඩි කාලයක් ඉහත දෙපාර්තමේන්තුවලට අනුයුක්තව සේවය කර ඇති නිලධාරීන්ගේ සේවා කාලය නියමිත දිනට අවසන් වන අතර තෝරා ගනු ලබන නව නිලධාරීන් වසර තුනක (03) කාල පරිච්ඡේදයක් සඳහා පමණක් අදාල දෙපාර්තමේන්තුව වෙත අනුයුක්ත කරනු ලැබේ.

ඉහත දෙපාර්තමේන්තුවල පවතින පුරප්පාඩු සංඛ්‍යාවට වඩා වැඩි අයදුම්පත් සංඛ්‍යාවක් ලැබුනහොත් සම්මුඛ පරීක්ෂණ මණ්ඩලයක් මගින් කුසලතා අනුපිළිවෙල මත පදනම්ව අනුයුක්ත කිරීම සඳහා නිලධාරීන් තෝරාගනු ලැබේ. මෙහිදී I වන කාර්යක්ෂමතා කඩඉම සමත්වී තිබීම, භාෂා ප්‍රවීනතා සම්පූර්ණ කර තිබීම, අයදුම්පත ඉදිරිපත් කරන පූර්වාසන්න පස් අවුරුදු කාල සීමාව තුළ උපයා ගත යුතුව තිබූ සියලු වාර්ෂික වැටුප් වර්ධක උපයාගෙන තිබීම හා ජ්‍යෙෂ්ඨත්වය සැලකිල්ලට ගනු ලබන අතර සර්වේයර් ජනරාල්ගේ තීරණය අවසන් තීරණය වේ.

ඉඩම් කොමසාරිස් ජනරාල් දෙපාර්තමේන්තුව/ දුම්රිය දෙපාර්තමේන්තුව/ වෙරළ සංරක්ෂණ සහ වෙරළ සම්පත් කළමනාකරණ දෙපාර්තමේන්තුවට අනුයුක්තව සේවය කරන කාලය තුළ ඔබගේ සියලු පඩිනඩි හා අනෙකුත් දීමනා එම දෙපාර්තමේන්තුව විසින් ගෙවනු ලැබේ පෞද්ගලික ලිපිගොනුවේ ආයතන කටයුතු ඉදිරියටත් මෙම දෙපාර්තමේන්තුවෙන් කරනු ලබන අතර, වාර්ෂික වැටුප් වර්ධක ගෙවීමට අදාළ රහස්‍ය වාර්තාව හා කාර්ය සාධන ඇගයුම් වාර්තාව දුම්රිය සාමාන්‍යාධිකාරී/ වෙරළ සංරක්ෂණ සහ වෙරළ සම්පත් කළමනාකරණ දෙපාර්තමේන්තුවේ අධ්‍යක්ෂ ජනරාල් වෙත යොමු කිරීමටත්, ඔහුගේ නිර්දේශය පරිදි වැටුප් වර්ධක ලබා දීමටත් කටයුතු කරනු ලැබේ.

අයදුම්පත් සඳහා www.survey.gov.lk වෙබ් අඩවියට පිවිස මාර්ගගත (Online) ක්‍රමය ඔස්සේ අයදුම් කළ යුතු අතර එම මාර්ගගත අයදුම්පත්‍රවල දෘඩ පිටපත් අධීක්ෂණ නිලධාරීගේ නිර්දේශය සහිතව 2022/04/30 දින හෝ ඊට පෙර සර්වේයර් ජනරාල්, මිනින්දෝරු දෙපාර්තමේන්තුව, අංක 150, කිරුළ පාර, නාරාහේන්පිට, කොළඹ 05 යන ලිපිනයට ලියාපදිංචි තැපෑලෙන් එවිය යුතුය.

**ඊ. දිසානායක**
**සර්වේයර් ජනරාල්**
**මිනින්දෝරු දෙපාර්තමේන්තුව,**
**අංක 150, කිරුළ පාර,**
**නාරාහේන්පිට**
**කොළඹ 05.**

මාර්ගගත ක්‍රමය ඔස්සේ අයදුම් කිරීම සඳහා මෙතනින් පිවිසෙන්න.

https://forms.gle/M7ff2raKaZKrBdLWA

කාර්යාලයීය ප්‍රයෝජනය සඳහා

| |
|---|
| |

ආදර්ශ අයදුම්පත්‍රය

ඉඩම් අමාත්‍යාංශය

මිනින්දෝරු දෙපාර්තමේන්තුව

**මිනින්දෝරු දෙපාර්තමේන්තුවේ සේවයේ නියුතු රජයේ මිනින්දෝරු නිලධාරීන්ගෙන් ඉඩම් කොමසාරිස් ජනරාල් දෙපාර්තමේන්තුව/ දුම්රිය දෙපාර්තමේන්තුව/ වෙරළ සංරක්ෂණ සහ වෙරළ සම්පත් කළමනාකරණ දෙපාර්තමේන්තුවේ පුරප්පාඩු පිරවීම සඳහා අයදුම්පත් කැඳවීම**

1.0

1.1 සම්පූර්ණ නම (සිංහලෙන්) : ..............................................................................................................

1.2 සම්පූර්ණ නම (ඉංග්‍රීසි කැපිටල් අකුරෙන්) : ..............................................................................................................

1.3 මුලකුරු අගට යොදා මුලකුරු සමඟ නම: (ඉංග්‍රීසි කැපිටල් අකුරින්): ..............................................................

1.4 ජාතික හැඳුනුම්පත් අංකය : ☐☐☐☐☐☐☐☐☐☐

1.5 උපන් දිනය : වර්ෂය ☐☐☐☐ මාසය ☐☐ දිනය ☐☐

1.6 2022/04/30 දිනට වයස : අවුරුදු............ මාස.................දින ..................

1.7 ස්ත්‍රී / පුරුෂභාවය : පුරුෂ ☐ ස්ත්‍රී ☐

1.8 විවාහක / අවිවාහක බව : විවාහක ☐ අවිවාහක ☐

2.0

2.1 ස්ථිර ලිපිනය (ඉංග්‍රීසි කැපිටල් අකුරෙන්) :..............................................................................................................

2.4 දුරකතන අංක - ජංගම : ...................................

ස්ථාවර : ...................................

3.0

3.1 සේවා කාලය පිළිබඳ විස්තර

(i) සේවය : ..............................................................................................................

ශ්‍රේණිය : ......................

2022/04/30 දිනට මුළු සේවා කාලය

මුල් පත්වීම් දිනය: ...............................................

ස්ථිර තනතුරට පත්වූ දිනය : ...............................................

(ii) සේවා කාලය තුළ වෙනත් දෙපාර්තමේන්තුවකට අනුයුක්තව සේවය කර තිබේද : ........................................

ඔව් නම් එසේ අනුයුක්තව සේවය කළ කාලය : ..............................

අනුයුක්ත කර තිබූ දෙපාර්තමේන්තුව : ........................................................................

(iii) අයදුම් කිරීමට අපේක්ෂා කරන දෙපාර්තමේන්තුව : ........................................................................

4.0 අයදුම්කරුගේ සහතිකය :

මෙහි සඳහන් කර ඇති තොරතුරු මාගේ දැනීමේ හා විශ්වාසය පරිදි සත්‍ය බව ප්‍රකාශ කරමි.

දිනය : .............................

..........................................
අයදුම්කරුගේ අත්සන

5.0 මිනින්දෝරු අධිකාරිගේ නිර්දේශය

මෙම ..................................................... සේවය කරන ........................................................................ මයා/මිය/මෙනවියට ඉඩම් කොමසාරිස් ජනරාල් දෙපාර්තමේන්තුව/ දුම්රිය දෙපාර්තමේන්තුව/ වෙරළ සංරක්ෂණ සහ වෙරළ සම්පත් කළමනාකරණ දෙපාර්තමේන්තුවේ මිනින්දෝරු තනතුරට ඉල්ලුම් කිරීමට අවශ්‍ය සුදුසුකම් සපුරා ඇති බව ද ඔහු/ඇය මෙම තනතුර සඳහා තෝරා ගනු ලැබුවහොත් මෙම අංශයෙන්/ ප්‍රාදේශීය කාර්යාලයෙන් නිදහස් කරන බවද 2022/04/30 දිනට වයස අවුරුදු 52 ට නොවැඩි බව ද සඳහන් කරමින් ඔහුගේ/ඇයගේ ඉල්ලුම් පත්‍රය නිර්දේශ කර මේ සමඟ ඉදිරිපත් කරමි.

..........................................
දිනය

..........................................
මිනින්දෝරු අධිකාරිගේ අත්සන හා නිල මුද්‍රාව

6.0 ජ්‍යෙෂ්ඨ මිනින්දෝරු අධිකාරිගේ නිර්දේශය

........................................................................................................................................................................
........................................................................................................................................................................

..........................................
දිනය

..........................................
ජ්‍යෙෂ්ඨ මිනින්දෝරු අධිකාරිගේ අත්සන හා නිල මුද්‍රාව

7.0 පළාත් සර්වේයර් ජනරාල්ගේ නිර්දේශය

........................................................................................................................................................................
........................................................................................................................................................................

..........................................
දිනය

..........................................
පළාත් සර්වේයර් ජනරාල්ගේ අත්සන හා නිල මුද්‍රාව